ප්‍රශ්න පත්‍ර සඳහා පිවිසෙන්න.
http://iscolee.blogspot.com/

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 06 |

# දෙවන වාර පරීක්ෂණය - 2018

# ගණිතය

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..........................................................

..........................................................

කාලය : පැය **02** යි.

## I - කොටස

❖ **ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

1) 3645 සංඛ්‍යාවේ 6 ඉලක්කමෙන් නිරූපණය කෙරෙන අගය කුමක්ද?

2) 0.25 භාගයක් ලෙස ලියා දක්වන්න.

3) ඉඳි ආප්ප 10 ක මිල රුපියල් 35 ක් නම් ඉඳි ආප්ප 100 ක මිල කීයද?

4) -2 සහ 1 අතර ඇති සියළුම නිඛිල සංඛ්‍යා ලියන්න.

5) පහත කොටුව තුළ ඇති සංඛ්‍යා අතුරින් 2 න් හා 5 න් යන සංඛ්‍යා දෙකෙන්ම ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා තෝරා ඒවා රවුම් කරන්න.

2002    700
405
502
300

6) $\frac{3}{8}$ ට තුල්‍ය භාගයක් ලියන්න.

7) රූපයේ අඳුරු කර ඇති කොටස භාගයක් ලෙස ලියන්න.



8) මිනිත්තු 150 ක කාලය පැය සහ මිනිත්තු වලින් ලියන්න.

9) කම්කරුවකුගේ දිනක වැටුප රු.1200කි. එවැනි කම්කරුවන් 100 ක් සඳහා දිනකට වැටුප් සඳහා වැය වන මුදල සොයන්න.

10) සනක රාමුවෙන් දක්වා ඇති සංඛ්‍යාව ලියන්න.




11) 20002002 සංඛ්‍යාව සම්මත අකාරයට කියවන ආකාරය ලියන්න.

12) පැයට කිලෝ මීටර් 60 ක වේගයෙන් ගමන් කරන මෝටර් සයිකලයක් පැය $\frac{1}{2}$ ක දී ගමන් කරන දුර කොපමණද?

13) අඹ ගොඩකින් $\frac{1}{3}$ ක අඹගෙඩි 15 ක් තිබුණි නම් ගොඩේ තිබුණු මුළු අඹගෙඩි ගණන කියද?

14) පළමු වේදිකාවට පැමිණි සීඝ්‍රගාමී දුම්රිය 21:20 ට කොළඹ කොටුව බලා පිටත් වෙයි. දුම්රිය පිටත් වීමට නියමිත වේලාව පැය 12 ක්‍රමයට ලියන්න.

15) සිසුවෙකුට තෑගි දීම සඳහා රුපියල් 450 ක මුදලක් අවශ්‍ය වේ. සිසුන් 35 ක් සිටින පංතියක සියළුම සිසුන්ට තෑගි ලබා දීමට අවශ්‍යවන මුදල සොයන්න.

16) 36 $cm$ ක් දිග කම්බියක් නැවීමෙන් සමචතුරස්‍රාකාර හැඩයක් සකස් කරයි නම් එම සමචතුරස්‍ර හැඩයේ පැත්තක දිග සොයන්න.

17) රූපයේ වෘත්ත තුනටම පොදු ප්‍රදේශය අඳුරු කරන්න.



18) $\frac{1}{10}$ ....... $\frac{1}{100}$ යන භාග > හෝ < ලකුණ යොදා සන්සන්දනය කරන්න.

19) 3 සහ 4 යන සංඛ්‍යා දෙකෙහිම ගුණාකාරයක් වන කුඩාම සංඛ්‍යාව කුමක්ද?

20) එක්තරා සංඛ්‍යාවක් 30 න් බෙදූ විට 20 ක් ඉතිරිවේ. එම සංඛ්‍යාව 15 න් බෙදූවිට කීයක් ඉතිරි වේද?

## ගණිතය - II කොටස

❖ **පළමු ප්‍රශ්ණය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**

01

a) රූපයේ දැක්වෙන්නේ කම්බි රවුම් හා බල්බ යොදාගෙන නිර්මාණය කර ඇති සැරසිල්ලක මුල් රවුම් 4 සහිත රූප සටහනකි.



පළමු රවුමේ බල්බ එකක්ද දෙවන රවුමේ බල්බ 3 ක් ද ආදී වශයෙන් රවුම් 10 ක් මෙම නිර්මාණය තුල ඇත.

i. මුල් කම්බි රවුම් 5 හි ඇති බල්බ ගණන පිළිවෙලින් ලියන්න. (ල 02)

ii. එම සංඛ්‍යා වලින් නිරූපනය වන සංඛ්‍යා රටාව හඳුන්වන නම කුමක්ද? (ල 01)

iii. නිර්මාණයේ 10 වන රවුමේ ඇති බල්බ ගණන සොයන්න. (ල 03)

iv. එක ලග පිහිටි කම්බි රවුම් දෙකක බල්බ ගණන වෙන වෙනම එකතු කර අළුත් නිර්මාණයක් සකස් කලහොත් එහි ඇති බල්බ රටාව ලියා එම රටාවේ ඇති සංඛ්‍යා හඳුන්වන නම ලියන්න. (ල 03)

b)

i. උපුලි ලග වෙරළු ගෙඩි 30 ක් ඇත. එය ඇයගේ යෙහෙලියන් අට දෙනා අතර සමසේ බෙදිය හැකි දැයි හේතු දක්වන්න. (ල 02)

ii. 30 හි සියළුම සාධක සෙවීම සඳහා පහත හිස් කොටු සම්පූර්ණ කරන්න. (ල 04)




iii. එමගින් 30 හි සියළුම සාධක ලියන්න. (ල 01)

02)

a) $A, B, C, D, E$ යනු වෙළෙඳුන් පස් දෙනෙකුගේ දිනක වෙළඳාමෙන් ලැබූ ලාභ හා අලාභ ප්‍රමාණ පහත සංඛ්‍යා රේඛාවේ දක්වා ඇත.(මෙහි ඍන සංඛ්‍යා අලාභ ලෙසද ධන සංඛ්‍යා ලාභ ලෙස ද ගන්න)




i. වෙළඳාමෙන් ලාභ ලැබුවේ කවුරුන්ද? (ල 02)

ii. ලාභ හෝ අලාභ නොලැබූ වෙළෙන්දා කව්ද? (ල 01)

iii. පහත හිස්තැන් වලට < හෝ > ලකුණ යොදන්න. (ල 03)

A ............B

D ............E

D............B

b) ගනේෂ් තම පන්තිය ඉදිරිපිට ඇති $A$ කොඩිගස ළඟ සිට $10\ m$ ක් නැගෙනහිර දිශාවට ගමන් කර $B$ ස්ථානයට පැමිණේ. නැවත $B$ සිට $10\ m$ ක් දකුණු දිශාවට ගමන් කර $C$ ස්ථානයට පැමිණේ.

i. ගනේෂ්ගේ ගමන් මාර්ගය දළ සටහනක ඇඳ දක්වන්න. (ල 02)

ii. $C$ ස්ථානයේ සිට බලන විට ගනේෂ්ට $A$ කොඩිගස පෙනෙන දිශාව කුමක්ද? (ල 01)

c) ඔබේ පන්ති කාමරයේ දැකිය හැකි තිරස් තලයකට හා සිරස් තලයකට උදාහරණයක් බැගින් ලියන්න. (ල 02)

03)

a) i. සංවෘත සරල රේඛීය තල රූපයක් ඇඳ නම් කරන්න. (ල 02)

ii. 


රූපයේ දක්වා ඇති තල රූපය හඳුන්වන විශේෂ නම ලියන්න. (ල 01)

iii. රූපයේ පෙන්වා ඇති කෝණ වර්ග හඳුන්වන නම් ලියන්න. (ල 03)

$a -$

$b -$

$c -$

b) i. පහත දක්වා ඇති පතරම භාවිතා කර සෑදිය හැකි ඝනවස්තුවේ නම ලියන්න. (ල 01)



ii. එම ඝන වස්තුවේ,

මුහුණතක හැඩය ......................................

මුහුණත් ගණන .....................................

ශීර්ෂ ගණන ......................................

දාර ගණන ..................................... ලියන්න. (ල 04)

04) a) අකිල තමා ලග තිබූ චොකලට් එකකින් $\frac{3}{8}$ ක් මල්ලිට ද $\frac{1}{4}$ ක් නංගිට ද දෙන ලදී

i. නංගිට හා මල්ලිට යන දෙදෙනාටම දුන් ප්‍රමාණය චොකලට් එකෙන් කවර භාගයක්ද? (ල 03)

ii. දෙදෙනාටම දුන් පසු ඉතිරි වන ප්‍රමාණය චොකලට් එකෙන් කවර භාගයක්ද? (ල 02)

iii. අකිල වැඩි කොටසක් දුන්නේ කාට ද හේතු දක්වන්න. (ල 02)

b) i. පහත දශම ආරෝහණ පිළිවෙලට සකස් කරන්න. (ල 02)

0.5, 0.29, 0.52, 0.06

ii. 15.2 +1.32 එකතු කරන්න. (ල 02)

05) a) මාධව ගේ නිවයේ සිට $A$ නගරයට දුර $7\ km\ 800m$ කි. $B$ නගරයට දුර $10km\ 500m$ කි.

i. මාධවගේ නිවසට ළගම පිහිටි නගරය කුමක්ද? (ල 02)

ii. නිවසේ සිට $A$ හා $B$ නගර දෙකට ඇති දුරෙහි වෙනස කොපමණද? (ල 02)

iii. රූපයේ දක්වෙන්නේ ත්‍රිකෝණාකාර උද්‍යානයක සැලස්මකි. එම උද්‍යානය වටා, වට 3 ක් ඇවිද ගිය විට ගෙවා යන මුළු දුර සොයන්න. (ල 03)




b) i. $500\ l$ ක ධාරිතාවයක් ඇති ටැංකියක් සම්පූර්ණයෙන් ජලයෙන් පිරී ඇත. එයින් $275\ l\ 800ml$ ක ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගත් විට ඉතිරි වන ජල පරිමාව සොයන්න. (ල 02)

ii. $1l\ 500\ ml$ ක ද්‍රව පරිමාවක් මැන ගැනීම සඳහා යොදාගත හැකි භාජන වගුවේ දක්වේ. එම භාජන වලින් මැනිය යුතු වාර ගණන සඳහන් කරන්න.(ද්‍රව අපතේ නොයන බව සළකන්න.) (ල 02)

| ද්‍රව පරිමාව | මැනීමට යොදා ගන්නා භාජනයේ පරිමාව | මැනිය යුතු වාර ගණන |
|---|---|---|
| $1l\ 500\ ml$ | $100\ ml$ | ................ |
| $1l\ 500\ ml$ | $250\ ml$ | ................ |

06) a) i. ප්‍රථමක සංඛ්‍යාවක හා සංයුක්ත සංඛ්‍යාවක වෙනස කුමක්ද? (ල 01)

ii. පහත කොටුව තුල ඇති සංඛ්‍යා ප්‍රථමක හා සංයුත ලෙස වෙන්කර රවුම් තුල ලියන්න. (ල 02)




iii. සදුනි ගණිත විෂයට ලබා ගත් ලකුණු ආසන්න 10 ට වැටයු විට 80 ක් විය. සදුනිගේ නියම ලකුණු සඳහා තිබිය හැකි,

අඩුම අගය ......................

වැඩිම අගය ...................... ලියන්න. (ල 02)

iv. ගොවියකු තම $2000\ kg$ ක වී අස්වැන්නෙන් $300\ kg$ ක් නිවසේ පරිභෝජනයට තබාගෙන ඉතිරිය $1\ kg$ ක් රු.40 බැගින් විකුණන ලදි. වී අලෙවියෙන් ගොවියා ලැබූ මුදල සොයන්න. (ල 03)

b)

i. ඔබේ උපන් දිනය අන්තර් ජාතික සම්මත ක්‍රමයට ලියන්න. (ල 01)

ii. එක්තරා වැඩක් නිම කිරීමට සුනිල් පලමු දිනයේ පැය 5 මිනිත්තු 40 ක් ද දෙවන දිනයේ පැය 2 මිනිත්තු 35 ක් ද වැඩ කළේය. වැඩය සඳහා සුනිල්ට ගත වූ මුළු කාලය සොයන්න. (ල 02)